ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ හා එහි පරිපාලිත සමාගම - 2020

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ (“සමාගම”) හා එහි පරිපාලිත සමාගමේ (“සමූහය”) 2020 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ හා සමූහයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**
**-------------------------------------------------------------------------------------**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.**

**මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**

- **අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**

- **කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.**

- **සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.**

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ 23.17 වගන්තියට අනුකූලව කොන්ත්‍රාත් ආදායම හා වියදම වාර්තාකරණ කාල පරිච්ඡේදයට අදාළව කොන්ත්‍රාත් කටයුතුවල නිමැවුම් අදියර අනුව හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සමාගමේ කොන්ත්‍රාත් ආදායමවූ රු.මිලියන 72.40 ක් ප්‍රමිතියට අනුව හඳුනා ගෙන නොතිබුණි. | ව්‍යාපෘති ගිණුම්කරණ ප්‍රමිත 23.17 වගන්තිය අනුව සේවා දායකයා විසින් සහතික කරන ලද වැඩ හා 2020-12-31 දිනට අපගේ ඉංජිනෙරු මහතා විසින් අදාල වර්ෂයට සහතික කරන ලද වැඩ ප්‍රමාණය ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව, සේවාදායක විසින් සහතික කරන ලද වැඩ වටිනාකම අනුව කොන්ත්‍රාත් ආදායම හඳුනා ගත යුතුය. |
| (ආ) | තොග ගිණුම් තැබීම සඳහා වූ කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයේ 13.4 වගන්තිය අනුව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගිණුම් ගත කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම සතුව පැවති රු.මිලියන 13.23 ක නිමි භාණ්ඩ තොගය අගයකිරීමේදී ශුද්ධ උපලබ්ධි අගය සැලකිල්ලට නොගෙන තොගය පිරිවැයට ආගණනය කර තිබුණි. | සියලුම තොග (FIFO) යටතේ පවත්වාගෙන යන අතර, ශුද්ධ උපලබ්ධි අගය හා පිරිවැය අනුව තොග ගණනය කිරීමේදී පිරිවැය සෑම විටම ශුද්ධ උප ලබ්දි අගයට වඩා අඩු අගයක් ගන්නා බැවින් තොග පිරිවැයට ගණනය කර ඇත. | මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව තොගය ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතයේ 2.26 (ආ) වගන්තියට අනුව හඳුනාගත් අලාභ කඩිනමින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ අලාභයක් ලෙස හඳුනාගත යුතු වුවද 2012 - 2017 කාලපරිච්ඡේදය තුළ සමාගම විසින් ක්‍රියාත්මක කර අසාර්ථක වූ කොන්ත්‍රාත් වෙනුවෙන් දරන ලද රු.මිලියන 24.39 ක් අලාභයක් ලෙස හඳුනා ගැනීමට කටයුතු නොකර කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ ලාභය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | 2012-2018 කාලසීමාව තුල ප්‍රශ්ණකාරී වැඩබිම් ලෙස හදුනාගත් මෙම කොන්ත්‍රාත්තු වල ගැටලු නිරාකරණය වනතෙක් කේරිගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර ඇත.<br><br>මෙම වැඩබිම් වල ගැටලු නිරාකරණය කිරීමෙන් පසු 2021 වර්ෂයේ ලාභඅලාභ ගිණුමට ගැලපීම් සිදුකරනු ඇත. තවද මෙම ව්‍යාපෘතින් වල බිල්පත් සේවාදායකයා විසින් සහතික කර නොමැත. | මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අනුව කොන්ත්‍රාත් අලාභය ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | ප්‍රමිත අංක 3.14 - ශේෂ පත්‍රයේ ඉකුත් වර්ෂයේ ලාභාංශ වශයෙන් රු. මිලියන 3.64 දක්වා තිබූ නමුත් සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු වියදම් වශයෙන් සටහන් අංක 30 ට එම අගය ඇතුළත් කර නොතිබුණි. | මෙය ගෙවියයුතු වියදමක් ලෙස ශේෂ පත්‍රයේ කෙටි කාලීන වගකීම් යටතේ වෙනම පෙන්වා ඇති අතර විගනනයෙන් දක්වා ඇති පරිදි ඉදිරි වර්ෂයේදි සටහන් අංක 30 ට අන්තර් ගත කිරිමට කටයුතු කරණු ලැබේ. | මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අනුව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සටහන් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.2.2 අනුව ගිණුම් වර්ෂයක් අවසානයේදි නිශ්චිතව හඳුනාගන්නා ලද ණයගැතියන් වෙනුවෙන් පමණක් අඩමාන ණය වෙන්කිරිම සිදුකළද සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර කාලයක සිට අයවිය යුතු රු. 20,138,019 ක හා වර්ෂ 5 ට වැඩි ලැබිය යුතු රු.374,233 ක ණය ගැතියන් 9 දෙනෙකුගේ ණය ගැති ශේෂ සඳහා අඩමාන ණය ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි. | අප විසින් නිශ්චිතව හඳුනා ගන්නා ණය ගැතියන් වෙනුවෙන් පමණක් අඩමාණ ණය වෙන් කරන අතර අපගේ ණය ගැතියන් හා ණය ගැති වෙන්කිරිම් එහි සඳහන්ව ඇති වසර 2 - 5ත් අතර ණය ගැතියන්ගෙන් ණය එකතු කිරිමට මේ වන විට කටයුතු කරගෙන යන අතර ඔහුන්ගෙන් එම මුදල් අප වෙත ලැබිමට නියමිතය. තවද මෙම මුදල්හි කොටසක් 2021 වර්ෂයේදි සමාගමට ලැබි ඇත. | සියළුම ණය ගැතියන් නිශ්චිතව හඳුනාගෙන අඩමාන ණය වෙන් කිරීම කළ යුතුය |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ක්‍රියාත්මක කර අසාර්ථක වූ කොන්ත්‍රාත් **12** ක් වෙනුවෙන් දරන ලද රු.**6,566,361** ක් **2012** වර්ෂයේ සිට කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර මෙම අලාභය ඉදිරියට ගෙනා ලාභයට නොගළපා සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් වියදමක් ලෙස කපාහැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් ලාභය එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි. | මෙම කොත්ත්‍රාත් **12**ට අදාලව මුදල් අය කරගැනිමට කටයුතු කල නමුත් කොත්ත්‍රාත් නිමවීමෙන් පසු සිදු කරන ලද අඩුපාඩු සකස් කිරිම මත සිදු කල වියදම් බැවින් එම මුදල් අය කරගැනිමට නොහැකි වී ඇත. ඒ අනුව **2019** විගණන වාර්තාව අනුව මෙම මුදල් **2020** වර්ෂයේ වියදමක් ලෙස කපාහැර ඇත. තවද මෙම වටිනාකම් සේවාදායකයා සහතික නොකළ අතර මෙම මුදල් අයකරගැනිමෙදි ගැටලු පැවතුණි. | පෙර වසර වලට අදාළ ගැළපීම් එම වසරට අදාළ වන ලෙස ගැළපිය යුතුය. |

### 1.5.4 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි සමාගමේ ඉදිකිරීම් ව්‍යාපෘති, කර්මාන්ත ශාලාවලින් ලද ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.මිලියන **75** කින් පහළ ගොස් තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් අලාභය රු.මිලියන **91.02** ක් විය. එමෙන්ම පසුගිය වර්ෂ **05** ක කාලය තුල සමාගමේ කර්මාන්ත ශාලාවල දායකත්වය අඛණ්ඩව සෘන අගයක් ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම රු.මිලියන **42** ක සෘණ අගයක් විය. මෙලෙස ආදායම පහළ යෑම මත සමාගම ලබාගත් ණය ආපසු ගෙවීමට ශක්‍යතාවයක් නොවීම සමාගමේ අඛණ්ඩ පැවැත්මට අහිතකර ලෙස බලපා තිබුණි. | **2020** වසරේ රටෙහි පැවතුන කොවිඩ් වාතාවරණය මත ඉදිකිරීම් ව්‍යාපෘති සිදුනොවූ බැවින් ඉදිකිරීම් ව්‍යාපෘති ලබාගැනීමට නොහැකි වූ අතර, කර්මාන්තශාලා සඳහා ද මෙම තත්වය සෘජුව බලපා ඇත. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකිරීම හා ගෘහස්ථ නිෂ්පාදනයන් හා තරඟ කිරීමට නොහැකි වීම මත හා බදු සමග නිෂ්පාදනයන් අලෙවි කිරීමට නොහැකිවීම මත දිගින් දිගටම කර්මාන්තශාලා අලාභ ලබන තත්වයට පත්වී ඇති අතර මේ සඳහා ඉදිරියේදී යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | සමාගමේ ව්‍යාපාර අංශ ඵලදායීව කළමනාකරණය කිරීම මත සමාගමේ ආදායම කඩිනමින් වැඩි කර ගත යුතුය |

**1.6** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.**20,025,161** ක ලැබිය යුතු සවලියකරන අත්තිකාරම් ශේෂය තුළ අය නොවී පවතින වර්ෂ **2 - 5** ත් අතර කාලයට අදාළ රු.**2,626,578** ක අත්තිකාරම් ශේෂය හා වර්ෂ **5** ට වැඩි රු. **11,314,371** ක අත්තිකාරම් ශේෂයන් අයකර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | මෙම රු. **20,025,161** ක මුදල **ICTAD** නියමයන් පරිදි අදාල ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ලබාදී ඇති සවලීකරණ අත්තිකාරම් වන අතර බිල් පත්‍ර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේවා පියවා ගැනීමට කටයුතු කරනු ඇත. මෙම කොන්ත්‍රාත්තු බිල්පත් නොගෙවා නැවැත්වීම මත රු.**11,936,153.15** ක සවලීකරණ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට නොහැකි වී ඇති අතර, රු.**8,089,007.85** ක කොන්ත්‍රාත්තු නිම වෙමින් පවතින අතර, බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසු නිරවුල් වනු ඇත. | ලැබිය යුතු අත්තිකාරම් කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.**74,582,406** ක ලැබියුතු රඳවාගත් මුදල් ශේෂය තුළ වර්ෂ **2-5** ත් අතර කාලයට අදාළ රු.**34,546,493** ක් වූ රඳවාගත් මුදල් ශේෂය හා වර්ෂ **5** ට වැඩි රු.**26,334,301** ක් වූ රඳවාගත් මුදල් ශේෂයන් අයකර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | මෙම ලැබිය යුතු රු. **74,582,406** ක රඳවාගත් මුදල් වලින් මිලියන **17.0** ක මුදල සඳහා කොන්ත්‍රාත් මේ වසරේ නිමකරමින් පවතින අතර ඉතිරි මුදල් ලබාගැනීම සඳහා ලිපි ඉදිරිපත් කර ඇත. තවද අපගේ අමාත්‍යාංශය හරහාද මෙම මුදල් ලබාගැනීමට කටයුතු කර ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ණය ගැතියන්ගෙන් සමාගමට අයවිය යුතු රු.**72,656,276** ක ශේෂයෙන් වර්ෂ **1-2** ත් අතර කාලයකට අදාළ රු.**2,109,876** ක්ද වර්ෂ **2-5** ත් අතර කාලයකට අදාළ රු.**26,337,108** ක්ද වර්ෂ **5** කට වඩා වැඩි කාලයකට අදාළ රු.**8,952,943** ක්ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ණය ගැතියන් **18** ක ගෙන් අයකර ගත යුතුව පැවති රු. **11,515,198** කින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන නොතිබුණි. | මෙම රු. **73,656,276.13** ක මුදලින් මිලියන **23.0** ක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂයන් වේ. තවද රු. මිලියන **0.45** ක ශේෂයක් එල් ආර් ඩී සී සේවා සමාගමෙන් ලැබිය යුතු වේ. සම්පූර්ණ මුදලින් රු. මිලියන **3.54** ක අඩමාන ණය ලෙස ද වෙන්කර ඇත. කොන්ත්‍රාත් සිදුකිරීම මගින් රු. මිලියන **38.46** ක් ලැබීමට ඇති අතර නාගරික සංවර්ධන අධිකාරියෙන් රු. මිලියන **7.82** ක මුදල ඉල්ලුම් කර ඇත. තවද බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් රු.මිලියන **13.64** ක් ලැබීමට ඇති අතර එයින් රු. මිලියන **03** ක මුදලක් මේ වනවිට ලැබී ඇත. අනෙකුත් මුදල් මේ වනවිට පියවා ඇත. | අයවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාගමේ කටයුතු වෙනුවෙන් අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආයතන 4 ක් සමග ඇතිකර ගෙන තිබූ බැඳීම්වලින් ඉවත්ව තිබුණද ඒ වෙනුවෙන් ලබාදී තිබූ රු.282,616 ක තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම තැන්පතු වලට අදාල සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම රු.282,616 ක මුදල් අයකරගැනිමට කටයුතු කළද එම ආයතන විසින් අදාල පොත් පත් තුලනය කර අවසන් බව සඳහන් කර ඇත වසර 10 කට වඩා පැරණි බැවින් 2021 වර්ෂයේදි පොත් වලින් ඉවත්කිරිමට කටයුතු සිදු කරනු ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.47,124,471 ක ගෙවියුතු සවලීයකරන අත්තිකාරම් ශේෂය තුළ වූ රු.15,038,730 ක් වර්ෂ 2-5 ත් අතර කාලයක සිටද රු. 20,794,782 ක් වර්ෂ 5 ට වැඩි කාලයක සිටද ගෙවිය යුතුව පැවතුණි. සමාගම නවතා දමා ඇති ව්‍යාපෘති 11 කට අදාළව ඉකුත් වර්ෂය අවසානයටද පැවති රු.12,630,077 ක සවලීයකරණ අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම රු.47,124,471 ක ගෙවිය යුතු සවලීකරණ අත්තිකාරම් මුදල ICTAD නියමයන් පරිදි අදාල ආයතන විසින් අප වෙත ලබාදී ඇති අතර, රු.22,986,306.88 ක අත්තිකාරම් නවතා දමා ඇති ඉදිකිරීම් ව්‍යාපෘති වන බැවින් ඉතිරිව ඇත. එම ආයතන සමග එකඟතාවයකට පැමිණීමෙන් පසු මෙම මුදල් නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ. ඉතිරි සවලීකරණ අත්තිකාරම් සේවාදායක ආයතන විසින් බිල්පත්‍ර නිරවුල් කිරීමෙන් පසු පියවීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු අත්තිකාරම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.60,265,583 ක ගෙවිය යුතු රඳවාගත් මුදල් ශේෂය තුළ වර්ෂ 2-5 ත් අතර කාලයට අදාළ රු.26,783,078 ක් වූ අත්තිකාරම් ශේෂය හා වර්ෂ 5 ට වැඩි රු.18,197,670 ක් වූ අත්තිකාරම් ශේෂයන් නිරවුල් කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | මෙම රු. 60,265,583 ක ගෙවිය යුතු රඳවාගත් මුදල් අපගේ සේවාදායකයින් විසින් අප වෙත මුදාහල පසු ගෙවීමට කටයුතු කරන අතර එම මුදල් මේ වනවිට ඉල්ලුම්කර ඇත. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ සහ කොන්ත්‍රාත් ණය හිමි ශේෂය රු.123,530,841 ක් වූ අතර එයින් වර්ෂ 2-5 ත් අතර කාලයට | මෙම ගෙවිය යුතු ණය හිමි ශේෂය රු.119,449,039 ක මුදලින් රු. 67,468,742.56 ක් ශ්‍රී ලංකා ඉඩම් | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| අදාළ රු.48,447,824 ක් වූ නිරවුල් නොකළ ශේෂය සහ වර්ෂ 5 ට වැඩි රු.15,747,375 ක ශේෂයන් නිරවුල් කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෙවිය යුතු අතර රු. 27,048,528.11 ක මුදලක් එල්.ආර්.ඩී.සී. සේවා සමාගම වෙත ගෙවිය යුතු වේ. ඉතිරි රු.24,931,768.33 ක ණය හිමි ශේෂයෙන් රු.13,893,481.84 ක් මේ වනවිට පියවා ඇත. | යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට කොන්ත්‍රාත් ණය හිමි ශේෂය රු.4,081,802 ක් වූ අතර එයින් වර්ෂ 5 ට වැඩි නිරවුල් නොකළ ශේෂය රු.3,324,728 ක් විය. | මෙම බිල්පත් අදාල ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර තවමත් එය සහතික වී නොමැත බිල්පත් සහතික වී මුදල් ලැබීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු යොදනු ඇත. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 27.05 ක් සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු වුවද එම වටිනාකම සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු ලෙස රු. මිලියන 27.62 ක් දක්වා තිබීමෙන් ඒ අතර රු. මිලියන 0.57 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම මිලියන 0.57 ක මෙම බිල්පත සහතික වී නොමැති බැවින් ගිනුම් වල පෙන්වා නොමැත. | සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නිසි පරිදි දැක්විය යුතුය. |
| (ආ) සමාගමේ නිලධාරියෙකු 2018 වර්ෂයේ සිදු කළ විදෙස් ගමනක් වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෙවිය යුතු රු.647,992 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන වටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙයට එකඟ වන අතර සමාගමේ මූල්‍ය තත්වය යහපත් වූ විගස මෙම රු. 647,992 ක මුදල පියවීමට කටයුතු කරනු ඇත. | සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නිරවුල් කර ගත යුතුය. |

## 1.8 නීති, රීති රෙගුලාසි හා කළමණාකාරිත්ව තීරණ යනාදියට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) සමාගමේ මූල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහය 3.2.1 (ඇ) 4 වගන්තිය | කිසියම් නිලධාරියෙකුට ලබා දෙන අත්තිකාරම් මුදල් අදාළ කාර්යය නිමකර දින 20 ක් තුළ පියවිය යුතු වුවත්, නිලධාරීන් 5 දෙනෙකු වෙත ලබා දී තිබු රු.139,454 ක් | මෙයින් රු. 100,000 මුදලක් මෙ වන විට පියවා ඇත. රු.5000 ක මුදලක් විකුණුම් අංශයට මුදල් හුවමරු කිරිම සඳහා ලබාදි ඇත. රු. 10,000 ක මුදල අදාල | අදාළ කාර්ය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විට දින **678** සිට දින **1457** ක් ගතවීත් පියවීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරියාගෙන් අය කිරිම සඳහා අවසන් ගිණුම් පිලියෙල කිරිමට යොමු කර ඇත. ඉතිරි රු. **24,454** ක මුදල අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු යොදා ඇත. මෙම ප්‍රමාදයට හේතුව බිල්පත් ලැබීම ප්‍රමාදවීම වේ. | |
| (ආ) **2003** ජූනි **02** දිනැති **PED/12** චක්‍රලේඛයේ **8.1.4** වගන්තිය | වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සමාගම් ස්වයං මූල්‍යනය මත පවත්වාගෙන යා යුතු වුවද ඉකුත් වර්ෂවල ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලබාගත් රු.මිලියන **264** ක ණය මුදල සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ පැවති මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සියයට **36** ක් විය. තවද සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ඉකුත් වර්ෂවල ලබා ගත් බැංකු අයිරාවලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට තවදුරටත් පියවීමට ඉතිරිව තිබු මුදල රු.මිලියන **10.11** ක් විය | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමග සම්බන්ධ වී සිදුකරන ලැබූ මුහුදුවැලි ව්‍යාපෘතිය සඳහා මෙසෙ සංස්ථාවෙන් දායකත්වය ලබාගත් අතර මෙම ව්‍යාපෘතිය සාර්ථක නොවූ බැවින් නවතාදමා අදාල මුදල් පියවීමට කටයුතු සිදුකර ඇත. | සමාගම ස්වයං මූල්‍යනය මත පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ බදු පෙර ශුද්ධ අලාභය රු. මිලියන **91.02** ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය වූ රු. මිලියන **48.97** සමඟ සැසඳීමේදි සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන **42.05** ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට අනුරූපිව කොන්ත්‍රාත් ආදායම සහ සිමෙන්ති ගල් හා පෙර සවි විකිණීමේ ආදායම පිළිවෙලින් රු. මිලියන **61** කින් හා රු. මිලියන **10** කින් අඩුවීම හා මූල්‍ය වියදම රු. මිලියන **22** කින් ඉහළයාම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-----------------------------------

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාගමේ කොන්ත්‍රාත් ආදායම රු. මිලියන 61 කින්, පහළ යාම මත කොන්ත්‍රාත් ආදායම අඩු වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ දළ ලාභය රු. මිලියන 10.8 කින් පිරිහීම මත දළ ලාභ ආන්තිකය සියයට 7.65 සෘණ අගයක්ද ගෙන තිබුණි. එමෙන්ම සමාගමේ සියළුම කර්මාන්තශාලා වල සමුච්චිත දායකත්වය රු. මිලියන 42 ක සෘණ අගයක පැවැතිමද මෙයට හේතු වී තිබුණි.

(ආ) සමාගමේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් සියයට 0.71 හා 0.56 ක් වී තිබුණි. මේ අනුව සමාගමේ ණය කළමනාකරණ ක්‍රියාවලිය සතුටුදායක තත්ත්වයක නොතිබුණු අතර එම අනුපාතයන් එකට වඩා අඩු අගයක් ගැනීම නිසා සමාගම කාරක ප්‍රාග්ධන දුෂ්කරතාවලට මුහුණපා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ වෙළඳ ණය හිමියන් රු. මිලියන 46.6 කින් ඉහළ ගොස් ඇති අතර මෙය ඉකුත් වසර හා සැසඳීමේදී සියයට 64 ක වැඩිවීමකි. සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් නොපියවූ ණය හිමියන් 18 දෙනෙකුගේ ණය ශේෂය රු. මිලියන 1.2 කින් වැඩි වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ණය ස්කන්ධ අනුපාතය 31.65 කින් අඩුවුවද සමාගමෙහි දිගුකාලීන ණයට ප්‍රාග්ධන අනුපාතය පෙර වර්ෂය හා සැසඳීමේදී 1.11 කින් ඉහළ අගයක් ගැනීම තුළින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් නිරූපණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ මුළු ණය හිමියන් රු.මිලියන 328 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගය රු. මිලියන 277 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේදී ණය හිමියන් සියයට 18 ක වැඩි වීමක් සිදු වී තිබුණි.

3. මෙහෙයුම් සාමලෝචනය
--------------------------

3.1 කර්මාන්තශාලාවල දායකත්වය
----------------------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ සමාගමේ අයවැය අනුව සමාගමේ කර්මාන්තශාලා 08 හි හා වැඩ පළෙහි අපේක්ෂිත දායකත්වය රු. මිලියන 20.12 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට තත්‍ය දායකත්වය රු.මිලියන 42.45 ක සෘණ අගයක් විය. | අයවැය අනුව ලාභදායී තත්වයට පත්කිරීමට කටයුතු කළද ශ්‍රී ලංකාවේ පැවතුන කොවිඩ් වසංගත තත්වය මෙයට සෘජුව බලපෑ අතර ඉල්ලුම පහල යෑම මත අපගේ විකුණුම් පහල යාම සිදුවිය. ඒ අනුව මෙම කර්මාන්තශාලා වල දායකත්වය සෘණ අගයක්ව පැවතීමට බලපා ඇත. | කර්මාන්තශාලාවල දායකත්වය ධන අගයක්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට නාවල පෙරසවි කර්මාන්තශාලාව හැර අනෙකුත් කර්මාන්තශාලා 07 හා වැඩ පළෙහි මෙහෙයුම් ප්‍රතිඵලවල දායකත්වය රු.මිලියන 62.25 ක සෘණ අගයක් ගෙන තිබුණි. විකුණුම් පහළ | අප විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් සිමෙන්ති ගල් කර්මාන්තශාලාව හැර අනෙකුත් කර්මණ්තශාලා වල අලාභය පෙර වසරට වඩා අඩුකල හැකි වූ අතර මුහුදු වැලි පැකට් කිරිමේ කර්මාණ්තශාලව විශාල | වැඩ බිම ලාභ ලබන තත්ත්වයට පත් කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | වැටීම, වෙළඳපළ ඉලක්ක කළ අලෙවි උපක්‍රම භාවිතා නොවීම, කළමණාකරන අකාර්යක්ෂමතාවය යන කරුණු මෙම අලාභයට හේතු වී තිබුණි. එමෙන්ම උක්ත අංශ වලින් සමාලෝචිත වර්ෂයේදී සමාගම අපේක්ෂා කළ ආදායම රු. මිලියන **230.78** ක් වූ අතර සත්‍ය ආදාය රු. මිලියන **28.23** ක් විය. | අලාභයක් ගන්නා බැවින් එය මව් සමාගමට පැවරීමට පියවර ගන්නා ලදි. ඒ අනුව ඉදිරි වර්ෂවලදී ලාභ ලබාගැනීමට අපෙක්ශිතය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සමාගම අපේක්ෂා කළ ආදායමට ලගාවිය නොහැකි විය | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට නාවල සිමෙන්ති නිෂ්පාදන වැඩ බිමෙහි අලාභය රු. මිලියන **13.95** ක් වු අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන **2.85** ක වැඩි වීමකි. තවද සමාලෝචිත වර්ෂයේ අයවැයගත විකුණුම්වලට සාපේක්ෂව තත්‍ය විකුණුම් ආදායම සියයට **78** ක අඩු වීමක්ද, වර්ෂයේ වැඩ බිමෙහි සේවක වැටුප් පිරිවැය රු. මිලියන **10.3** ක් වු අතර එය සමාලෝචිත වර්ෂයේ වැඩ බිමෙහි මුළු ආදායමට වඩා රු. මිලියන **2.2** ක වැඩිවීමක්ද පෙන්නුම් කරන අතර සේවක පිරිවැය වැඩිවීම නාවල සිමෙන්ති ගල් නිෂ්පාදන වැඩ බිමෙහි මෙහෙයුම් අලාභය වැඩිවීම කෙරෙහි ඍජුවම බලපා තිබුණද වැඩ බිමෙහි ආලභය අවම කර ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට සමාගමේ නිසි කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය හෙතුවෙන් රට මාස **6**කට වඩා වසා දැමිණි. ඒ අනුව ලංකාවේ ඉදිකිරිම් කර්මාන්තය ඇණ සිටි බැවින් අයවැය ගත විකුණුම් වලට සාපේක්ෂව සත්‍ය විකුණුම් අදායම සියයට **78** ක අඩු විය. අපගේ මෙම කර්මාන්ත ශාලාවේ ස්ථිර සේවක හා කාර්ය මණ්ඩලය වෙත වසා දැමු මාස **6** ක කාලසිමාවේ සම්පූර්ණ වැටුප් ගෙවිමට සිදුවිය. නමුත් විකුණුම් අඩුවිම මත මුළු අදායමට වඩා රු. මිලියන **2.2** ක වැටුප් ගෙවිමට සිදු විය. තවද එම වැටුප් පිරිවැය වැඩ බිමෙහි මුළු අදායමට සාපේක්ෂව සියයට **128** ක ප්‍රමාණයකි. මෙය අවම කිරිම සඳහා අප විසින් ස්ථිර සේවක මණ්ඩලයෙන් කොටසක් තෙත්බිම් උද්‍යානය වෙත මරු කල අතර ඉදිරියෙදි සම්පූර්ණයෙන්ම ස්ථිර සේවක මණ්ඩලය නවතා නිෂ්පාදනය කරන ගල් ප්‍රමාණය මත පමණක් ගෙවිමට කටයුතු යොදමින් පවතියි. | වැඩ බිම ලාභ ලබන තත්ත්වයට පත් කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය |
| (ඈ) | නාවල වැඩපලෙහි නිෂ්පාදන කටයුතු නිසි පරිදි පවත්වා ගැනීමට විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය නොකොට එහි සේවකයින් ඉකුත් වර්ෂයේ සිට කෙරවලපිටිය වැලි ව්‍යාපෘතිය සඳහා යෙදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දායකත්වය රු. මිලියන **4.75** ක සෘණ අගයක් විය. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන **2.95** ක හෙවත් සියයට **164** ක සෘණ වර්ධනයක් විය. එමෙන්ම | අප විසින් විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස මෙසේ එහි සේවකයින් ඉකුත් වර්ෂයේ සිට කෙරවලපිටිය වැලි ව්‍යාපෘතිය සඳහා යෙදවීම සිදු කල අතර කොවිඩ් වසංගතය හෙතුවෙන් යකඩ ඉදිකිරිම් කර්මාන්තය ඇණ සිටි නමුත් එහි සේවකයින් වෙත වැටුප් ගෙවිමට සිදුවිය. උපාය මර්ගික තිරණයක් ලෙස මෙම සේවකයින් වහාම කෙරවලපිටිය කර්මාන්ත ශාලාව වෙත ස්ථාන මරුවක් සිදු කර අප විසින් තාවකාලික පදනම | වැඩ බිම ලාභ ලබන තත්ත්වයට පත් කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය සදහා අයවැය ගත විකුණුම් ආදායම රු.මිලියන 14 ක් වුවද වර්ෂය තුළ කිසිදු විකුණුම් ආදායමක් ලබාගෙන නොතිබුණි. | මත ලබාගත් කෙරවලපිටිය කර්මාන්ත ශාලාවේ සෙවය කරන සෙවකයින් එයින් ඉවත් කර පිරිවැය අවම කරගත් අතර උපරිම කර්යක්ෂමතවයක් ස්ථිර සේවක මණ්ඩලයෙන් ලබාගන්නා ලදි. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී කෙරවලපිටිය මුහුදු වැලි සේදීමේ ව්‍යාපෘතිය මගින් රු.මිලියන 151.13 ක ආදායමක් අපේක්ෂා කර තිබුණි. ඒ අනුව මුහුදු වැලි සෝදා සංස්ථාවට සැපයීමේ ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේදී වැලි කියුබ් 36,000 ක නිෂ්පාදනයක් සැපයීම සදහා සැලසුම් කර තිබුණද තත්‍ය නිෂ්පාදනය කියුබ් 9,305 ක ප්‍රමාණයක් විය. එමෙන්ම සමාගම මෙම ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේදී තත්‍ය වශයෙන් ලැබූ ආදායම රු. මිලියන 13.45 ක් පමණක් වූයෙන් එය අපේක්ෂිත ආදායමෙන් සියයට 9 ක් පමණක් විය. එසේම ව්‍යාපෘතිය සදහා අවශ්‍ය බැකෝ යන්ත්‍ර හා ටිපර් රථ කුලී පදනම මත ලබා ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් රු.මිලියන 2.68 ක වියදමක් දරා තිබූ අතර එය මුළු ආදායමින් සියයට 20 ක පමණ අගයක් ගෙන තිබුණි. | කොවිඩ් වසංගතය හෙතුවෙන් රට මාස 6කට වඩා වසා දැමීම මත අපගේ නිෂ්පාදන අඩාල වූ අතර කොවිඩ් වසංගතය කර්මානිතශාලාව අතර බහුලව පැතිරීම හෙතුවෙන් එම කර්මාන්තශාලව නිරොධායන මධයස්ථානයක් බවට පත් කිරීමට සිදු විය. ඒ අනුව අපේක්ෂිත අදායම් වලට ලගාවීමට නොහැකි වූ අතර ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ලබාදුන් පිළිතුර අනුව ක්‍රියාමාර්ග ගනු ඇත. | අපේක්ෂිත නිෂ්පාදනය සිදුකර ව්‍යාපෘතිය ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයේදී රු.මිලියන 404.40 ක් වැය කර ආරම්භ කරන ලද වැලි පැකට් කිරීමේ කර්මාන්ත ශාලාවෙන් මාසිකව රු. මිලියන 8.22 ක ලාභයක් අපේක්ෂා කර තිබුණද වැලි පැකට් නිෂ්පාදනය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු කර නොතිබුණු අතර ව්‍යාපෘතිය තුළින් සමාලෝචිත වර්ෂය තුළ ලැබූ රු.මිලියන 26.70 ක අලාභයද සමගින් වර්ෂය අවසානයට සමාගම ලැබූ සමුච්චිත අලාභය රු. මිලියන 54.97 ක් විය. තවද සමාලෝචිත වර්ෂයේ මෙම ව්‍යාපෘතිය මගින් සමාගම අපෙක්ෂා කළ ආදායම රු. මිලියන 316.8 ක් වුවද තත්‍ය වශයෙන් ලබාගත් ආදායම රු. මිලියන 0.36 ක පහළ අගයක් විය. | මෙම කර්මාන්ත ශාලාව ඉදිකර ඇත්තේ මව් සමාගමට අයත් භූමිය තුලය. නිසි අධ්‍යයනයකින් තොරව සිදුකර ඇති මෙම ව්‍යාපෘතිය මගින් ඉදිරියේදීද අපේක්ෂිත ලාභදායිකත්වයක් ලබා ගැනීමට නොහැකි වන බව කළමනාකරනයේ අදහස වේ. රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම් මත සමාගමට වැයවී ඇති පිරිවැයෙන් නිදහස් කිරීමට මව් සමාගම කටයුතු කරනු ඇත. | දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයෙන් මිදීමට අවශ්‍ය පියවර ගත යුතුය |

| | | |
|---|---|---|
| (උ) ඉකුත් වර්ෂය අවසාන වන විට හිඟුරක්ගොඩ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු නවතා දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටද කර්මාන්ත ශාලාවේ උපකරණ කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | හිඟුරක්ගොඩ කර්මාන්තතශාලාව පවත්වාගෙන යාමෙදි වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම මෙහෙයුම් අලාභයක් ඇති විම නිසා නවතා දැමූ අතර කර්මාන්තශාලාව බදු දීමට හෝ වෙනත් ව්‍යාපාරික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලැසුම් කර ඇත. | වත්කම් නිෂ්ක්‍රීයව නොතබා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේ ත්‍රිකුණාමලය කර්මාන්ත ශාලාවේ සමස්ථ විකුණුම් ආදායම රු.මිලියන **0.06** ක් වූ අතර කර්මාන්ත ශාලාවේ අලාභය රු. මිලියන **0.91** ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්ත ශාලාවේ කටයුතු නවතා දමා තිබුණි. | ත්‍රිකුණාමලය කර්මාන්තශාලාව අවට පවතින තරඟකාරිත්වය හා අමුද්‍රව්‍යය සොයා ගැනිමට ඇති අපහසුවද නිසා මෙම කර්මාන්තශාලාවද වර්ෂ ගණනාවක සිට පාඩු ලබන අතර ඉහත කී අනුව මෙම කර්මාන්තශාලව වෙතද ඉදිරියෙදි කටයුතු සිදු කරනු ඇත. | වත්කම් නිෂ්ක්‍රීයව නොතබා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි කටයුතු කළ යුතුය. |
| (එ) අම්පාර කර්මාන්ත ශාලාවේ සමාලෝචිත වර්ෂයේ අයවැය ගත විකුණුම් ලෙස රු.මිලියන **5.71** ක් ඇස්තමේන්තුගත කර තිබූ නමුත් තත්‍ය විකුණුම් ආදායම රු. මිලියන **2.40** ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ විකුණුම් වලට සාපේක්ෂව රු. මිලියන **3.31** ක හෙවත් සියයට **58** ක අඩුවීමක් විය. | අප විසින් ලාභදායි තත්වයට ලඟාකර ගැනිම සඳහා අයවැය සකස් කර ක්‍රියාත්මක කල අතර කොවිඩ් වසංගතය හෙතුවෙන් එම ඉලක්ක ලඟා කර ගැනිමට අපොහොසත් වු නමුත් පෙර වර්ෂයට වඩා අලාභය අඩුකර ගැනිමට හැකි විය | ප්‍රශස්ථ අයවැය සැලැස්මක් ක්‍රියාවට නංවා ලාභය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2014** ඔක්තෝබර් **10** දිනැති අංක **1382** දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු.**4,555,193** ක ලාභාංශයක් ප්‍රකාශයට පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ **6** ක් ඉක්මගොස් ඇතත් එම ලාභාංශ ගෙවීමට සමාගම අපොහොසත් වී තිබුණි. | එම කාලයේ සමාගම ලාභ ඉපයීම මත මෙම ලාභාංශයක් ප්‍රකාශයට පත්කර තිබුණද මුදල් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුල්‍ය ප්‍රවහායක් නොතිබු බැවින් දිගින් දිගටම මෙම ලාභාංශ ගෙවීමට නොහැකි වී ඇත මුල්‍ය තත්වය යහපත් වූ විගස මෙම ගෙවීම් සිදු කරනු ඇත. | ප්‍රකාශයට පත් කළ ලාභාංශ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) සමාගමේ මුල්‍ය අවශ්‍යතා ණය දෙන ආයතනයකින් හෝ වාණිජ බැංකුවකින් සපුරා ගැනීමකින් තොරව **2017** හා **2019** වර්ෂවලදි වැටුප් සහ වේතන ගෙවීම සඳහා මව් සමාගම වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් රු. මිලියන **64** ක් ලබාගෙන තිබු අතර එම ණය මුදල හා සංස්ථාවෙන් ලබාගෙන ඇති සමස්ථ ණය මුදල් සඳහා සමාලෝචිත | සමාගමේ මුල්‍ය අවශ්‍යතා සපුරා ගැනිමට වාණිජ බැංකුවකින් ණය ඉල්ලුම් කල නමුත් ඒ සඳහා ඇපයන් තැබිමට සමාගම සතුව වත්කම් නොමැතිවු බැවින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් රු. මිලියන **64** ක් ලබාගන්නා ලදි. | ණය මුදල් හා පොළිය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය තුළ සමාගම විසින් ගෙවිය යුතු ණය පොළිය රු. මිලියන **33.50** ක්ද සමගින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු මුළු ණය පොළිය රු. මිලියන **60.98** බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ගනුදෙනුවක් සිදු නොවූ ජංගම ගිණුම් දෙකක පැවති ශේෂය රු.**220,826** ක් විය. | මෙම ගිණුම් දෙක **2021** වර්ෂයෙදි වැසිමට කටයුතු කරනු ඇත. | අක්‍රිය ගිණුම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුහුදු වැලි පැකට් නිෂ්පාදනය කිරීමේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශිය ඉදිකිරීම් සමාගම ඉදිරිපත් කළ ලංසු ඇගයීමක් නොකර රු. මිලියන **265.03** ක් වැයකර විදේශිය සැපයුම්කරුවකු මගින් මෙය ඉදිකිරීමට සමාගම කටයුතු කිරිම හේතුවෙන් සිදුවී ඇති බවට නිරීක්ෂණය වු අක්‍රමිකතා සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විදේශීය සැපයුම්කරුවන්ගෙන් මෙම ගොඩනැගිලි ඉදිකිරීමට සමාගම් කටයුතු කිරිම නිසා නිරීක්ෂණය වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු මේ වනවිට සිදුකරන අතර, අදලා වාර්ථා මා වෙත ලැබූ පසු අක්‍රමිකතාවයන්ට සම්බන්ධිත පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පරීක්ෂණ කටයුතු කඩිනමින් කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2018** වර්ෂයේදී වැඩ අවසන් කළ යුතු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන **10.69** වු ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩමක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට **21** ත් හා සියයට **60** ත් අතර පහළ අගයක් විය. | විදුලි බල මණ්ඩලයට අයත් ව්‍යාපෘතියට අදාලව ව්‍යාපෘතිය ආරම්භ කිරිම සඳහා වු අත්තිකාරම් මුදල වන රු. **2.232.882.25** පමණක් අප වෙත නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම් කොට ඇත. ඒ නමුදු ව්‍යාපෘතිය කර ගෙන යෑම සඳහා නිරාකරණය කළ යතු කරුණු සම්බන්ධයෙන් සේවාදායකයාගෙන් නිසි පිළිතුරු ලැබී නොමැති හෙයින් ව්‍යාපෘතියෙහි වැඩ අඩාල වී ඇත. | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | **2018** වර්ෂයේ ආරම්භ කරන ලද **2019** වර්ෂයේ අප්‍රේල් වැඩ අවසන් කළ යුතු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන **19.89** ක් වු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාලාවක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය | මුදල් ප්‍රතිපාදන නොමැති විම නිසා සේවාදායකයා විසින් ගෙවීම් ප්‍රමාදවිම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය අඩු අගයක් ගැනිින. මෙම හේතුව මතද, **2020** වසර තුල පැවති කොවිඩ් - **19** වසංගතය | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් |

| | | | |
|---|---|---|---|
| | අවසානයට භෞතික ප්‍රගතිය සියයට 75 ක් වී තිබුණද මූල්‍ය ප්‍රගතිය සියයට 37 ක් පමණක් විය. | හේතුවෙන් ද ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීම ප්‍රමාද වුවත් මේ වන විට වැඩ නිම කොට භාරදී ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 13.90 ක් වූ මුණ්ඩිගල ආරණ්‍ය සේනාසනයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 ජූලි 20 දින සමාගම භාරගෙන තිබුණු අතර එය දින 120 ක් තුළ අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 40 ක් හා සියයට 32 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට මෙම කොන්ත්‍රාත්තුව මගින් සමාගමට සිදුවූ අලාභය රු. මිලියන 4.79 ක් විය. | මෙම ව්‍යාපෘතිය කරගෙන යන අතරතුර සිදුකරන ලද වැඩ කොටස සහ අමතර වැඩ සඳහා අයවිය යුතු මුදල් අප වෙත ගෙවීම කර නොමැති අතර මෙ බව සේවාදායක පර්ශවය ලිපි මඟින් විටින් විට දැනුවත් කර ඇත. තවද, මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් කරන ලද විමසීම් සඳහා ද මේතෙක් පිළිතුරු ලැබී නොමැත. | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019.11.16 දිනට නිම කිරීමට එකඟව කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 26.93 ක් වූ බන්ධනාගාර ගොඩනැගිල්ල සැලසුම් කිරීම සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2012 වර්ෂයේදි සමාගම භාරගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කොන්ත්‍රාත්තුව භාරගෙන වර්ෂ 08 ක් ගතව තිබුණද කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 53 ක් පමණක් විය. එමෙන්ම ඉකුත් වර්ෂයේ සේවාදායක ආයතනයට ඉදිරිපත් කරන ලද රු.මිලියන 15.10 ක අවසන් බිල්පතට අදාල මුදල් 2021 ඔක්තෝබර් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය 2021/04/03 වන විට සියළුම වැඩ කටයුතු අවසන් කර2021/04/23 වන දින වැඩ බිම භාර දි අවසන් බිල්පත් ඉදිරිපත් කර ඇත. | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සමාගම අපේක්ෂා කළ කොන්ත්‍රාත් ආදායම රු. මිලියන 388 ක් වුවද ළඟා කර ගත් තත්‍ය ආදායම රු.මිලියන 72.40 ක් විය. ඒ අනුව තත්‍ය ආදායම අපේක්ෂා කළ අදායමෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 19 ක් විය. | ලොව පුරා පැවති කොරොනා වසංගතය හෙතුවෙන් රට පූර්ණ වශයෙන් හා අර්ධ වශයෙන් අවස්ථා කිපයක වසා දැමීම හෙතුවෙන් ආයතනය අඛණ්ඩව ක්‍රියාත්මක නොවූ අතර නව ව්‍යාපෘති හා පැවති ව්‍යාපෘති අපෙක්ෂා කළ පරිදි ඉටු කිරිමට නොහැකි විය. | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 4 ක ද්‍රවශීලතා හානි (Liquidated damages) රු. මිලියන 7.20 ක් සේවාදායකයින් විසින් අඩු කර ගෙන තිබුණි. | මෙම කොන්ත්‍රාත් සිදු කිරිමේදී සේවාදායකයන් මුදල් ගෙවීම ප්‍රමාද කිරිම මත හා අවශ්‍ය උපදෙස් නිසි වෙලාවට නොදිම හෙතුවෙන් අදාල කාර්යන් නිම කිරිමට ප්‍රමාදවූ නිසා අපගෙන් අයකරගෙන ඇති අතර ඔහුන් වෙතින් මෙම මුදල් ඉල්ලුම් කලද මේ වනතුරු යහපත් ප්‍රතිචාරයක් නොමැත. | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (උ) | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 13.40 ක් වූ සපුගස්කන්ද විශාඛා විද්‍යාලීය ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 අප්‍රේල් 24 දින අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 31 ක් වූ අතර එදිනට කිසිදු භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා අතිකාරම් මුදල වන 30% 2020/ 21 ලබාගත්තද, රටෙහි පැවති කොරොනා වසංගතය හෙතුවෙන් මෙම ව්‍යාපෘතිය භෞතිකව ආරම්භ කිරිමට අපේක්ෂා කළ කාලය ඉක්ම විය. මේ නිසා මෙම ව්‍යාපෘතිය උපකොන්ත්‍රාත් පිරිනැමීමට නැවත ලංසු කැදවීමට තිරණය කෙරුනු අතර මේ සඳහාද කාලයක් ගතවිය. | එකඟ වී ඇති පරිදි කොන්ත්‍රාත් කටයුතු සිදුකිරීමටත් බිල්පත් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.5** මානව සම්පත් කළමණාකරනය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩල 105 ක් වූ අතර එදිනට තත්‍ය කාර්යය මණ්ඩලය 65 ක් වුයෙන් එදිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 40 ක් විය. එසේම අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සේවක සංඛ්‍යාව 10 ක් විය. පුරප්පාඩු 40 න් මධ්‍ය කළමනාකරණ තනතුරේ පුරප්පාඩු 05 ක් වර්ෂ 06 ක සිට පුරප්පාඩුව පැවති අතර කළමනාකරණ සහකාර තනතුරු 13 ක් ද ස්ථිර කම්කරු තනතුරු 20 ක් ද පුරප්පාඩු වී තිබුණි. | මධ්‍යම මට්ටමේ කළමනාකාර තනතුරු පුරපුපාඩු සඳහා වරින වර කොන්ත්‍රාත් පදනම මත හා සේවා පැවරීමේ පදනම මත නිලධාරින් බඳවා ගත්තද ඔවුන් සේවයෙන් ඉවත්ව යන ලදී. කෙසේ නමුත් සමාගමේ මුලම්‍ය තත්වය මත මෙම පුරප්පාඩු පිරවීම කෙරෙහි දැඩි අවධානයත් යොමු නොකරන ලද අතර සමහර තනතුරු සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබාදෙමින් එම තනතුරු වල රාජකාරි කටයුතු ආවරණය කරගන්නා ලදී. | පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතු අතර සේවක මණ්ඩල තත්ත්වය අවශ්‍ය පරිදි අනුමැතිය සහිතව පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර තිබුණද සාමාන්‍යාධිකාරී තනතුරක් අනුමත කර නොතිබුණි. නමුත් එම තනතුර අනුමත කර ගැනීමෙන් තොරව තනතුරට පත්කිරීමක් කර තිබුණි. | සමාගම වෙත සමාන්‍යාධිකාරිවරයකු බඳවා ගැනිමකින් තොරව පත්කිරිමක් සිදුවන අතර ඒ සම්බන්ධව සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තිරණයක් ගත යුතු ඇත. කෙසේ නමුත් කළමණාකරණ චක්‍රලේඛ අංක :02/2016 ට අනුකූලව මෙම තනතුර සඳහා HM 2-1 ශ්‍රේණිය යටතේ වැටුප් පරිමාණයන් අනුමත කොට ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් මගින් ඉහළ කළමණාකරන තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාගමේ මධ්‍ය කළමණාකරන මට්ටමේ තනතුරක් වූ ගණකාධිකාරි තනතුර වර්ෂ කීපයක සිට පුරප්පාඩුව පැවති අතර එම තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද එවැනි වගකීම් සහිත තනතුරක් සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | මෙම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා 2021 වසරේ සිට නිසි උපදෙස් ඉල්ලා සිටියද ඒ සඳහා නිසි අනුමැතියක් මේ දක්වා ලැබී නොමැත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක පීඊඩී/12 සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් පරිදි සමාගම විසින් 2020 වර්ෂයට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් මාස 04 කට වඩා පමාවී 2021 ජූලි 27 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් මෙසේ ප්‍රමාද විය | මහා භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය |

### 4.2 අධ්‍යක්ෂමණ්ඩල රැස්වීම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 4.2.2 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ් වසංගතය ඒහෙතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි | නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

### 4.3 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති දරණ හා අංක පි.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ නියමයන්ට අනුව සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාල සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. | රටේ පැවතුනු වාතාවරණය හේතුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරිමට නොහැකි විය 2021 වර්ෂයෙදි පිළියෙල කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.4** ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් රු. මිලියන 2.22 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණද එම මිලදි ගැනීම් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මග පෙන්වීම්වලට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය ට අනුව ප්‍රසම්පදන් සිදු කල අතර 2021 වර්ෂයෙදි ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙල කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සැලැස්ම සකස් කළ යුතුය. |

**4.5** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර, සමාගමේ මව් සමාගම වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනයක් සිදු කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී විගණන විමසුම් 1 ක් පමණක් නිකුත් කර තිබුණි. සමාගමේ මෙහෙයුම් කටයුතුවල ධාරිතාවය අනුව එය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ගේ අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකුගේ සහභාගීත්වයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ඇත.<br><br>සමාගමේ මෙහෙයුම් කටයුතු වල ධාරිතාවය මේ වනවිට ප්‍රසාරණය වෙමින් පවතින බව අවබෝධ කරගෙන ඇත. ඒ අනුව, මව් සමාගමේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන විගණන කටයුතු ශක්තිමත්ව පුළුල් කිරීමට මේ වනවිට කටයුතු කර ඇත. එමෙන්ම සමාගමේ කළමනාකරණයට සහාය වීම පිණිස මව් සමාගමේ විගණන අංශයට රාජකාරිමය වශයෙන් වගකියන, අභ්‍යන්තර විගණන සහායකයකු පූර්ණ කාලීනව සමාගමේ සේවයට අනුයුක්ත කිරීමට (සමාගමේ පවතින සේවක දර්ශකයට අනුව) සමාගමේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බවද දැනුම් දෙමි. | අභ්‍යන්තර පාලනය නිසියාකාරව ක්‍රියාත්මක වීමට අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුය. |

**4.6** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ සමාගමේ අයවැය ගත ආදායම රු. මිලියන 672 ක් වූ අතර තත්‍ය ආදායම රු. මිලියන 141 ක් වූයෙන් අයවැය ගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස එය සියයට 21 ක් විය. අයවැය ගත වෙළඳ ලාභය රු. මිලියන 137 ක් වූවද තත්‍ය වෙළඳ අලාභය රු. මිලියන 6 ක් | අයවැය සමග මාසික ගිණුම් වාර්තා පිළියෙල කරනු ලබන අතර, අප අමාත්‍යාංශය වෙතද මෙම ගිණුම් ඉදිරිපත් කරනු ලබයි. රටෙහි පැවතුන වාතාවරණය අනුව හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කඩාවැටීම හා වැලි | අයවැය කළමණාකරන පාලන උපකරණයක් ලෙස කළමණාකරනය යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| විය. තවද අයවැය ගත ශුද්ධ ලාභය රු. මිලියන **84** ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට තත්‍ය වශයෙන් ලැබූ අලාභය රු. මිලියන **86** කි. මේ අනුව සමාගමේ අයවැය ගත දත්ත හා තත්‍ය දත්ත සමග සැසදීමේදි අයවැය ගත දත්ත අතාත්වික අයුරින් සකස් කරන ලද ඒවා වන බැවින් අයවැය ගත ඉලක්ක කරා ළගා වීම සඳහා කළමණාකරනය නිසි තීරණ ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය අසාර්ථක වීම මත මෙසේ අයවැය ගත ඉලක්ක සපුරා ගත නොහැකි විය. | |
| (ආ) **2003** ජුනි **02** දිනැති හා අංක පී.ඊ.ඩී/**12** දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **5.2.4** වගන්තියට අනුව වාර්ෂික අයවැය වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර **5.2.5** වගන්තියට අනුව අයවැය වාර්තාව සමාලෝචිත වර්ෂය ආරම්භයට දින **15** කට පෙර චක්‍රලේඛයේ සඳහන් පරිදි අදාළ ආයතන වලට ඉදිරිපත් කර නොතිබුණි. | රටෙහි පැවතුන වාතාවරණය අනුව හා නිෂ්චිත ලෙස අපවෙත අමාත්‍යංශයක් පත්කර නොතිබීම මත හා අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කිරිමට ප්‍රමාදවීම මත අදාල අනුමැතින් ලබාගැනිමට නොහැකි විය. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |